# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.20 පැය 0720 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 783 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

01. **බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකට වැලි පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2025.04.19 වන දින උදෑසන කාලයේ වාලච්චේන පොලිස් වසමේ කුවනේෂපුරම් ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකට වැලි පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු ට්‍රැක්ටර් රථය සමග අත්අඩංගුවට ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 30 යන වයස්වල පසුවන වාලච්චේන හා පූනානි ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

02. **නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුර.**

2025.04.19 වන දින රාත්‍රී කාලයේ රඹුක්කන පොලිස් වසමේ වහව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර තීරු බදු නොගෙවා මෙරටට ගෙන්වන ලද දුම්වැටි 1200ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රඹුක්කන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44ක් වන යටගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රඹුක්කන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**